ඇමුණුම

# දැන්වීමයි

යොමුව- නාරා/පාලන/2022/90/RL/ටෙන්ඩර් අංක

## ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය,කාක දූපත , මට්ටක්කුලිය ,කොළඹ-15

ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනනයේ (නාරා)සිට **කොට්ටාව දක්වා** කාර්ය මණ්ඩළය ප්‍රවාහනය කිරිම සදහා ප්‍රසම්පාදන මණ්ඩළය විසින් මාසිකව ගෙවීමේ පදනම මත කුළී වාහන ලබා ගැනීම වෙනුවෙන් ලංසු ඉදිරිපත් කරන ලෙසට මෙයින් ආරාධනා කරමි.

අදාළ වන්නාවූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛණය ලබා ගත හැක්කේ ආපසු නොගෙවන රු:1,000.00 ක මුදල් තැන්පතුවක් අධ්‍යක්ෂක ජනරාල්,නාරා නමින් තැන්පත් කිරිමෙන් පසුව මිලදී ගැනුම් හා සැපයුම් ඒකකය වෙතිනි.

**01.**අවශ්‍ය කෙරෙන වාහන පංතිය,ගමන් මාර්ගය හා අනෙකුත් පිරිවිතරයන් පහත දක්වා ඇත.කොන්ත්‍රාත් කාලය 2022/09/01 සිට 2023/03/15 දක්වා වේ.

| ප්‍රවාහන සේවාව | ගමන් මාර්ගය | එක් ගමන් මාර්ගයක දුර කි.මී | ආරම්භ කළ යුතු වේලාව හා ස්ථානය | ආපසු ගමන් කළ යුතු වේලාව හා ස්ථානය | වාහන පංතිය |
|---|---|---|---|---|---|
| කොට්ටාව-නාරා | කොට්ටාව වීරසිරි ස්ටෝර්ස් ඉදිරිපිට සිට අතුරිගිරිය පාර ඔස්සේ වල්ගම හන්දිය , ඥානවිමළ මාවත,අතුරිගිරිය, අතුරිගිරිය පාර , මාළඹේ,කොස්වත්ත,අග්ගොන,වල්පොළ පාර , රෝහල පාර,අංගොඩ,ශ්‍රී සුමන මාවත , කැළණිමුල්ල,කැළණි විහාරය,බියගම පාර,4 කණුව,නුවර පාර ,පැලියගොඩ වට රවුම,වික්ටෝරියා පාලම,තොටළඟ,ෆර්ගියුසන් පාර , විස්ට්වයික් පාර,සී බීච් පාර,නාරා පාර ඔස්සේ නාරා ප්‍රධාන කාර්යාලය දක්වා හා ආපසු එම මාර්ගයේම කොට්ටාව වීරසිරි ස්ටෝර්ස් දක්වා | කි.මි 28 | පෙ.ව 06.55 ට කොට්ටාව වීරසිරි ස්ටෝර්ස් ඉදිරිපිට සිට | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන් | 26 |

**02.**ලංසුවේ වලංගු කාලය ලංසු භාර ගන්නා අවසාන දිනයේ සිට වැඩකරන දින 90 ක් එනම්, 2023 ජනවාරි **මස 03** තෙක් විය යුතුය.

**03. ලංසු ඉදිරිපත් කිරිමේදී එක් ප්‍රවාහන සේවාවක් සඳහා පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගත් රු:15,000.00 ක ලංසු සුරක්ෂණයක් හෝ අධ්‍යක්ෂක ජනරාල්/නාරා නමින් , නාරා සරප් වෙත මුදල් ගෙවා එහි මුල් පිටපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය**

**04.**ලංසු ඉදිරිපත් කිරිමේදී ආකෘතියේ කපා හෝ මකා හෝ වෙනයම් ආකාරයකින් හෝ වෙනසක් සිදු කරන්නේ නම් එම ස්ථානයන් හි ස්වකීය කෙටි අත්සන හා මුද්‍රාව යොදා එම වෙනස් කිරිම සහතික කළ යුතු අතර,එසේ නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**05. අදාළ වන්නා වූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛණය නිකුත් කරනු ලබන්නේ 2022 අගෝස්තු මස 23 සිට 2022 සැප්තැම්බර් මස 01 වන දින දක්වා පමණි.මේ සම්බන්ධ පූර්ව ප්‍රසම්පාදන රැස්වීම 2022 අගෝස්තු මස 29 දින පෙ.ව 10.00 ට නාරා අධ්‍යක්ෂක ජනරාල් කාර්යාලයේදී පැවැත්වේ.**

**07.මුද්‍රා තබන ලද ඔබගේ ලංසුව 2022 සැප්තැම්බර් මස 02 වන දින ප.ව 01.00 ට පෙර ' ' සභාපති,ප්‍රසම්පාදන කමිටුව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනනය,කාක දූපත,මට්ටක්කුලිය,කොළඹ-15 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටා ඇති මුදල් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටි අංක-01 ට බහාලිමෙන් හෝ ඉදිරිපත් කළ හැකිය.**

**ලංසු බහාලන කවරය මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතු අතර,එම කවරයේ වම්පස ඉහළ කෙළවර "නාරා-කොට්ටාව දක්වා කාර්ය මණ්ඩළ ප්‍රවාහන සේවාව සඳහා මිළ ගණන් කැඳවීම-2022/ටෙන්ඩර් පෙට්ටි අංක- 01" යනුවෙන් සඳහන් කළ යුතුය.**

**08.2022 සැප්තැම්බර් මස 02 දින ප.ව 01.00 ට ඉදිරිපත් වී ඇති ලංසු එදින එම වේලාවට ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනනයේ (නාරා) මුදල් අංශයේදී විවෘත කරනු ලබන අතර ,එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකුට සහභාගි විය හැකිය.**

**09**.මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්,ප්‍රසම්පාදන නිළධාරි මගින් ලබා ගත හැකිය.

ප්‍රසම්පාදන කමිටු තීරණය අවසන් තීරණය වේ.

සභාපති
ප්‍රසම්පාදක මණ්ඩලය
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත ,මට්ටක්කුලිය
කොළඹ15-
0112/529717 -0112-521000

දිනය-2022 **අගෝස්තු** මස 23